# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1402 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 08/11/2023<br>පැය 1235 |

## මාධ්‍ය නිවේදනය

**ටී 56 ගිනි අවියක්, පිස්තෝල අවියක් සහ ජීව පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.11.06 වන දින මීගමුව පොලිස් වසමේ කුඩාපාඩුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර ටී 56 ගිණි අවියක්, එම පතරොම් ගැබ් 03 ක්, ටී 56 පතරොම් 87 ක්, පිස්තෝල අවියක්, මෙරට නිෂ්පාදිත ගිණි අවියක්, ෂොට්ගන් අවි සඳහා භාවිතා කරන පතරොම් 15 ක් සහ ව්‍යාජ අංක තහඩු 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**සැකකරු වයස අවුරුදු 25 ක් වූ මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම සැකකරු සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇති අතර ඉහත අත්අඩංගුවට ගෙන ඇති ටී 56 ගිණි අවියෙන් 2022.10.06 වන දින මිනුවන්ගොඩ ගමන්ගෙදර ප්‍රදේශයේ නිවසකදී පියෙකු සහ පුතුන් දෙදෙනෙකු වෙඩි තබා ඝාතන කිරීමට යොදා ගත් ගිණි අවිය බවට දැනට සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. මීගමුව පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.







**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**